ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

| | | |
|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | ඔබේ අංකය<br>உமது இல.<br>Your No . | දිනය<br>திகதி<br>Date. 2024.12.09 |

පැමිණිලි පාර්ශවය : එම්. කේ. නිලන්ති මේනකා මිය,
කැටගහහේන,
නෑහින්න,
දොඩංගොඩ.

වගඋත්තර පාර්ශවය : 01. කේ. ඒ. ඒ. විජේරත්න මිය,
ගුරු සේවය,
බප/කළු/නෑහින්න කණිෂ්ඨ විද්‍යාලය,
දොඩංගොඩ.

02. පී.එම්. සිංහබාහු මිය,
විදුහල්පති,
බප/කළු/නෑහින්න කණිෂ්ඨ විද්‍යාලය,
දොඩංගොඩ.

03. ඒ. යූ. වික්‍රමආරච්චි මයා,
කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ
කලාප අධ්‍යාපන කාර්යාලය,
කළුතර.

04. පො.ප. කේ. ඒ. බී. ප්‍රසාද් සිරිවර්ධන මයා,
ස්ථානාධිපති,
පොලිස් ස්ථානය,
දොඩංගොඩ.

**පැමිණිලි අංකය : HRC/HO/3394/24**

**පැමිණිල්ලේ කරුණු දැක්වීම :**

ඉහත නම් සඳහන් පැමිණිලිකාරිය විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත 2024.08.12 දිනැතිව පැමිණිල්ලක් ඉදිරිපත් කරමින් පහත කරුණු ඉදිරිපත් කර සිටී. පී.පී.ඩී. සෙනුරි ශාක්‍යා අභිමානී යන වයස අවුරුදු 05 යි මාස 07 ක සිය මිණිබිරිය බප/කළු/නෑහින්න කණිෂ්ඨ විද්‍යාලයේ පළමු වසරේ ඉගෙනුම ලබන බවත්, ඇයගේ දෙමාපියන් වෙන්ව ජීවත්වන බවත්, මව 2024 මාර්තු මස විදේශගත රැකියාවක් සඳහා ගොස් ඇති බවත්, පියා දැරිය බැලීමට පමණක් පැමිණෙන බවත්,

ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: අංක 14, ආර්. ඒ. ද. මෙල් මාවත කොළඹ -04. / இல. 14, ஆர்.ஏ.த.மெல் மாவத்தை, கொழும்பு -04. / No. 14, R.A.De Mel Mawatha, Colombo -04.
සභාපති / தவிசாளர் / Chairman: 011- 2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011- 2505541/74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrcsl@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone: 94-11-2505580 / 81 /82
ලේකම් / செயலாளர் / Secretary: 011- 2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

මිණිබිරිය තමාගේ ආරක්ෂාව යටතේ සිටින බවත් පැමිණිලිකාරිය විසින් ප්‍රකාශ කර ඇත. මෙම සිදුවීම සිදුවූ 2024.08.08 දින දහවල් සිය මිණිබිරියට ඇයගේ පන්තිභාර ගුරුතුමිය වන අනෝමා ගුරුවරිය විසින් පහරදුන් බව මිණිබිරිය විසින් තමාට පැවසූ බව ප්‍රකාශ කර ඇත. එසේ දැනුම්දීමෙන් පසුව පැමිණිලිකාරිය විසින් සිය මිණිබිරිය පරික්ෂා කිරීමේදී වේවැලකින් අමානුෂික ලෙස පහරදී ඇති බවට නිරික්ෂණය වූ බවත්, මිණිබිරියගේ ශරීරය පුරා වේවැල් පහර කෑම හේතුවෙන් ඉදිමී තිබූ බවත් ප්‍රකාශ කර ඇත. පසුව මෙම පහරදීම සම්බන්ධයෙන් එම පාසලේ විදුහල්පතිනිය වන සිංහබාහු මිය වෙත එදිනම දහවල් 12.30 ට පමණ පැමිණිලි කළ ද විදුහල්පතිනිය විසින් මෙකී පහරදීම සම්බන්ධයෙන් කිසිදු පියවරක් නොගත් බවත් ප්‍රකාශ කර ඇත. මෙම පහරදීම හේතුවෙන් එදින සවස්වන විට දරුවාට උණ රෝගය වැළඳුණු බවත්, පසු දින එනම් 2024.08.09 දින මෙම පහරදීම සම්බන්ධයෙන් පැමිණිලි කිරීමට කළුතර කලාප අධ්‍යාපන කාර්යාලය වෙත ගිය අවස්ථාවේදී තමාගෙන් සිදුවීම අසා කලාප කාර්යාලය විසින් මෙම සිදුවීමට අදාළව ලිපියක් ලියවාගත් බවත් පොලිසියට ගොස් පැමිණිල්ලක් දමන ලෙස උපදෙස් ලබාදුන් බවත් ප්‍රකාශ කර ඇත. එකී උපදෙස් අනුව තමා දොඩංගොඩ පොලිස් ස්ථානයට ගොස් පැමිණිලි කළ නමුත් පැමිණිල්ලට අදාළව කිසිදු පියවරක් නොගත් බවත්, දරුවා රෝහල්ගත කිරීමට හෝ උපදෙස් ලබානොදුන් බව ප්‍රකාශ කර ඇත. පසුව තමා විසින් දොඩංගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ළමා හිමිකම් හා ප්‍රවර්ධන නිලධාරිනිය හමුවී මෙම සිදුවීම පිළිබඳව විස්තර ප්‍රකාශ කළ බවත් තමාගේ දැනුමේ ප්‍රමාණය අනුව තමා විසින් පැමිණිලි කළ කිසිදු රාජ්‍ය ආයතනයකින් නීත්‍යානුකූලව පියවරක් නොගත් බවත් ප්‍රකාශ කර ඇත.

තවද තම මිණිබිරියට පන්තිභාර ගුරුතුමිය විසින් පහරදීමේ සිදුවීමෙන් පසු 2024.08.12 දින තමා පාසලට ගිය අවස්ථාවේදී පාසල් බූමිය තුළ රැස්ව සිටින ලද පාසලේ දරුවන්ගේ දෙමව්පියන් හය දෙනෙකු විසින් තමාහට පහරදුන් බවත්, ඒ පිළිබඳව තමා දොඩංගොඩ පොලිසියට පැමිණිලි කළ බවත් ප්‍රකාශ කර ඇත. එකී පැමිණිල්ල පිළිබඳව විමර්ශනය කරන අවස්ථාවේදී තමාගේ පැමිණිල්ල නිසි පරිදි සටහන් කරගෙන නොමැති බව හෙළිවූ බවත් මෙම පහරදීම සමථ මණ්ඩලයට යොමුකරන ලද බවත් වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත.

මෙම පැමිණිල්ල 2024.08.14 වන දි ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ලියාපදිංචි තැපැල මගින් ලැබී ඇති අතර ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් 2024.08.22 වන දින මෙම පැමිණිල්ල විභාගයට ගන්නා ලදි. එදින පැමිණිල්ල විභාගය සඳහා පළමුවන වන වගඋත්තරකරු වන කේ. ඒ. ඒ. විජේරත්න මිය (පන්තිභාර ගුරුවරිය) ද, දෙවන වගඋත්තරකරු වන පී. එම්. සිංහබාහු මිය (විදුහල්පති) ද, තෙවන වගඋත්තර පාර්ශවය වන ඒ. යූ. වික්‍රමආරච්චි මයා (කළාප අධ්‍යාපන අධ්‍යක්ෂ) කළුතර කලාප අධ්‍යාපන කාර්යාලය යන නිලධාරීන් සහභාගී විය. එහිදී මෙම සිදුවීමට අදාළව උක්ත වගඋත්තර පාර්ශවයන් වෙතින් ලබාගන්නා ලද ප්‍රකාශයන් පහත පරිදි වේ.

**වගඋත්තර පාර්ශවයේ කරුණු දැක්වීම :**

**පළමුවන වගඋත්තරකරු - කේ. ඒ. ඒ. විජේරත්න මිය (පන්ති භාර ගුරුවරිය)**

තමා කළුතර අධ්‍යාපන කලාපයේ බප/කළු/නැහින්න කණිෂ්ඨ විද්‍යාලයේ 2015 වසරේ සිට සේවය කරන බවත් 2009.11.18 දින සිට ගුරුසේවයට බැඳුණු බවත් ප්‍රකාශ කර ඇත. තමා උපාධිධාරී ගුරුවරියක් ලෙස සේවයට බැඳුණු අතර මෙම පාසලට පැමිණීමට පෙර කොටහේන සිංහල කණිෂ්ඨ විද්‍යාලයේ සේවය කර ඇති අතර මෙම පාසල තමා සේවය කරන ලද දෙවන පාසල බව සඳහන් කර ඇත. තමා මෙම පාසලේ සේවයට බැඳුණු දින සිට පළමුවන ශ්‍රේණිය භාර ගුරුවරිය ලෙස ඉගැන්වීම් කටයුතු සිදුකළ බවත් මෙම සිදුවීම සිදුවූ 2024.08.08 වන දින, දරුවන්ගේ උදෑසන ආහාර වේලෙන් පසු කුඩා ක්‍රියාකාරකම් කිහිපයක් ලබාදීමෙන් පසුව සිංහල පාඩම සහ ගණිතය පාඩමට අදාළ ක්‍රියාකාරකම් ආරම්භ කළ බව ප්‍රකාශ කර ඇත. මෙම පාඩම් සඳහා ඉගෙනුම් උපකරණ ලෙස පිල්ලම් සහිත අකුරු සහ ඉලක්කම්පත් භාවිතා කළ අතර ඒවා භාවිතා කරමින් අදාළ ක්‍රියාකාරකම් වල නියැලෙමින් පාඩම් නැවත මතකයට නගමින් සිටි බවත් ප්‍රකාශ කර ඇත. මෙම අවස්ථාවේදී සෙනුරි දරුවාට (පැමිණිල්ලේ අගතියට පත් පාර්ශවය) නැවත නැවතත් පරණ පාඩම් මතක් කර දුන්න ද ඇයට අමතක වන බැවින් නැවතත් එකම ක්‍රියාකාරකම ලබාදුන් බවත් ප්‍රකාශ කර ඇත. එසේ සිදු කළ ද කියාදුන් පාඩම අතපසු වූ බැවින් නැවත නැවතත් කියාදෙමින් එම ක්‍රියාකාරකම් කියා දීමට උත්සාහ කළ නමුත් ඒ සඳහා දැරිය අවධානය ලබානොදුන් බැවින් දරුවා අදාළ නිපුණතා මට්ටමට ගතයුතු බැවින් සත් භාවයෙන් තරවටු කිරීමක් සිදුකිරීමට සිදුවූ බවත් ප්‍රකාශ කර ඇත. තමා දරුවාට තරවටු කිරීම සිදුකරනු ලැබුවේ අනෙක් පන්තියේ දිග මැනීම සඳහා ගෙනවිත් තිබූ කුඩා කෝටුවක් මගින් බවත් එම අවස්ථාවේදී අනෙක් දරුවන් කෙරෙහි ද තමාගේ අවධානය තිබූ බැවින් මෙම දරුවාට පහරවල් කීයක් ගැසුවාද යන්න මතක නොමැති බවත් ප්‍රකාශ කර ඇත. මෙකී සිදුවීමේදී තමාගේ එකම අදහස වූයේ මෙම දරුවාට අවම නිපුණතා ප්‍රමාණය නියමිත කාලය තුළ ලබාදීම පමණක් වන බව වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත.

**දෙවන වගඋත්තරකරු - පී. එම්. සිංහබාහු මිය (විදුහල්පති)**

තමා බප/කළු/නැහින්න කණිෂ්ඨ විද්‍යාලයේ විදුහල්පති වශයෙන් වසර 14 ක් සේවය කරනු ලබන බවත් මෙම සිදුවීම සිදුවූ දින එනම් 2024.08.08 දින පහරකෑමට ලක් වූ දැරියගේ මිත්තණිය වන පැමිණිලිකාරිය තමා හමුවට පැමිණ, දැරියගේ පන්තිභාර ගුරුතුමිය වන අනෝමා විජේරත්න ගුරුවරිය විසින් තමාගේ මිණිබිරියට කෝටුවකින් පහරදී ඇති බවට ප්‍රකාශ කළ බව සඳහන් කර ඇත. පසුව තමා අදාළ දැරිය ළඟට පෙර පරික්ෂා කිරීමේදී දැරියගේ අත් දෙකේ දෙපැත්තේ සහ කොන්ද ප්‍රදේශයේ රතු පාට ලප දැකගත හැකි වූ බවත් දරුවාගේ ශරීරයේ තුවාල නොතිබූ බැවින් රෝහලක් වෙත යොමු කිරීම සම්බන්ධයෙන් නොසිතූ බවත් ප්‍රකාශ කර ඇත. එම අවස්ථාවේදී පැමිණිලිකාරිය විසින් සිය මිණිබිරිය මතක ශක්තිය අඩු දරුවෙක් බව ප්‍රකාශ කළ බැවින් දරුවාට අවශ්‍ය පෝෂණ අතිරේක ලබාදෙන ලෙසත් නිවසේදී අධ්‍යාපන කටයුතු සඳහා අවශ්‍ය සහයෝගය ලබාදෙන ලෙසත්

උපදෙස් ලබාදී මෙම පහරදීම සම්බන්ධයෙන් සොයාබලන බව දැන්වූ බවත් සඳහන් කර ඇත. පසුව තමා මෙම සිදුවීම පිළිබඳව අනෝමා විජේරත්න ගුරුවරිය වෙතින් විමසූ බවත් ගුරුවරිය විසින් සත්භාවයෙන් දරුවාට ඉගැන්වීම පිණිස එසේ සිදුකළ බවත් ප්‍රකාශ කළ බව සඳහන් කර ඇත. පසුව තමා විසින් ගුරුවරිය වෙත එවැනි වැරදි නොකරන ලෙසට තරයේ අවවාද කළ බව ප්‍රකාශ කර තිබේ. 2024.08.09 දින උදෑසන පහරකෑමට ලක්වූ දැරියට උණ වැළඳී ඇති බව ප්‍රකාශ කරමින් පැමිණිලිකාරිය නැවත පාසල වෙත පැමිණි බවත් එම අවස්ථාවේ තමා දරුවා පරික්ෂා කිරීමේදී අත්ලට දැනෙන ප්‍රමාණයේ රස්නයක් දැරියගේ ශරීරයෙන් නොදැනුණු බවත් ඒ වන විට ද පෙරදින දැරියගේ ශරීරයේ තිබූ රතු ලප දැකගැනීමට තිබූ බවත් සඳහන් කර ඇත. පසුව පැමිණිලිකාරිය කළුතර කලාප කාර්යාලය වෙත යන බව තමාට පවසා පිටව ගිය බවත් තමා විසින් මේ පිළිබඳව කළුතර කලාප අධ්‍යාපන කාර්යාලයේ පාසල් පාලන අධ්‍යක්ෂතුමිය දුරකථන මාර්ගයෙන් දැනුවත් කළ බවත් සඳහන් කර ඇත. මෙම සිදුවීම සම්බන්ධයෙන් පාසල් ලොග් සටහන් පොතේ සටහනක් ද යොදා පාසලේ නියෝජ්‍ය විදුහල්පතිතුමිය සහ ප්‍රාථමික අංශ ප්‍රධානී මහත්මිය සමග දරුවන් හමුවී කතා කළ බව සඳහන් කර ඇත.

දරුවන්ට ඉගැන්වීමේදී ඔවුන්ගේ මානසික තත්ත්වය පිළිබඳව අවබෝධයෙන් යුතුව ඉගැන්වීමේ කටයුතු සිදුකළ යුතු බවට ගුරු සාකච්ඡාවලදී මෙන්ම ගුරු සංවර්ධන වැඩසටහන් වලදී ද සියලුම ගුරුභවතුන් දැනුවත් කර ඇති බවත් ඊට අමතරව කලාප අධ්‍යාපන කාර්යාලේය කලාප අධ්‍යාපන අධ්‍යක්ෂතුමා විසින් ද ප්‍රාථමික අධ්‍යාපනය සම්බන්ධයෙන් නිකුත් කරන ලද ලිපිය 2024.01.09 දින ගුරුවරුන් වෙත ලබාදී තිබූ බවත් වැඩිදුරටත් සඳහන් කර ඇත. මෙම සිදුවීම සම්බන්ධයෙන් පැමිණිලිකාරිය විසින් දොඩංගොඩ පොලිස් ස්ථානය වෙත කරන ලද පැමිණිල්ල විභාග කිරීම සඳහා 2024.08.09 වන දින දොඩංගොඩ පොලිස් ස්ථානයේ ළමා හා කාන්තා කාර්යාංශයේ ස්ථානාධිපතිතුමිය විසින් අනෝමා විජේරත්න ගුරුවරියහට පොලිස් ස්ථානයට පැමිණෙන ලෙස දන්වා තිබූ බැවින් තමා ද නියෝජ්‍ය විදුහල්පතිතුමිය සමග පොලිස් ස්ථානයට ගොස් විමර්ශන කටයුතු සඳහා සහභාගී වූ බව සඳහන් කර ඇත. තමා 2024.08.12 දින පුද්ගලික නිවාඩුවක් ගෙන තිබූ බැවින් පැමිණිලිකාරිය විසින් සඳහන් කරන ලද පාසල් භූමියේදී සිදුවූ ගැටුම පිළිබඳව තමා නොදන්නා බවත් නියෝජ්‍ය විදුහල්පතිනිය විසින් පාසලෙන් පිටතදී මෙකී ගැටුම සිදුවූ බවට තමා දැනුවත් කළ බවත් වැඩිදුරටත් සඳහන් කර ඇත.

**තෙවන වගඋත්තර පාර්ශවය - ඒ. යූ. වික්‍රමආරච්චි මයා (කළාප අධ්‍යාපන අධ්‍යක්ෂ)**

කළුතර කලාප අධ්‍යාපන කාර්යාලයේ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ ඒ. යූ. වික්‍රමආරච්චි මහතා මෙම සිදුවීම පිළිබඳව ලබාදෙන ලද ප්‍රකාශය පහත පරිදි වේ. මෙම සිදුවීම සම්බන්ධයෙන් පැමිණිලිකාරිය විසින් 2024.08.09 දින කලාප අධ්‍යාපන කාර්යාලය වෙත පැමිණිලිකර ඇති බවත් ඒ පිළිබඳව 2024.08.12 වන දින දෙපාර්ශවය කැඳවා වැඩිදුර ප්‍රකාශ සටහන් කරගෙන තිබේ. මෙම සිදුවීමට සම්බන්ධ ගුරුවරිය වන අනෝමා විජේරත්න මෙනවිය මේන විට තාවකාලිකව බප/කළු/නැහින්න

කණිෂ්ඨ විද්‍යාලයේ සිට කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය වෙත මාරු කර ඇති අතර, මෙම සිදුවීම පිළිබඳව විමර්ශනයක් සිදුකර විමර්ශන වාර්තාව පළාත් අධ්‍යාපන කාර්යාලය වෙත යොමුකර ඇත. ඊට අමතරව පළාත් අධ්‍යාපන කාර්යාලය මගින් මේ සම්බන්ධයෙන් විධිමත් විනය පරීක්ෂණයක් පැවැත්වීමට චෝදනා පත්‍රයක් සකස් කරන ලෙස උපදෙස් ලබාදී ඇති බැවින් ඊට අදාළ කටයුතු සිදුවෙමින් පවතින බව පැමිණිල්ල විභාගයේදී කොමිෂන් සභාව වෙත ප්‍රකාශ කර ඇත. තවද මෙම සිදුවීම සම්බන්ධයෙන් කලාප අධ්‍යාපන කාර්යාලය ලෙස අවශ්‍ය මැදිහත්වීම සිදුකිරීමට කටයුතු කරන බව වැඩිදුරටත් ප්‍රකාශ කර තිබේ.

පැමිණිලිකාරිය විසින් සිය පැමිණිල්ලෙහි තමා දොඩංගොඩ පොලිස් ස්ථානයට 2024.08.09 වන දින සිය මිණිබිරියට පහරදීම සම්බන්ධයෙන් සිදුකරන ලද පැමිණිල්ල සහ 2024.08.12 දින පාසලේ දෙමාපියන් හය දෙනෙකු විසින් තමාට පහරදීම සම්බන්ධයෙන් සිදුකරන ලද පැමිණිල්ල නිසියාකාරව විමර්ශනය නොකළ බවට සඳහන් කර තිබූ බැවින් කොමිෂන් සභාව විසින් 2024.10.30 දින දොඩංගොඩ පොලිස් ස්ථානය මෙකී පැමිණිල්ල විභාග කිරීම සඳහා කැඳවන ලදි. එහිදී ලබාගත් ප්‍රකාශ පහත පරිදි වේ.

**හතරවන වගඋත්තර පාර්ශවය - ස්ථානාධිපති, පොලිස් ස්ථානය දොඩංගොඩ.**

2024.10.30 දින පවත්වන ලද විභාගය සඳහා දොඩංගොඩ පොලිස් ස්ථානයේ ස්ථානාධිපති වෙනුවෙන් එම පොලිස් ස්ථානයේ ළමා හා කාන්තා කාර්යාංශයේ ස්ථානාධිපති කාන්තා උප පොලිස් පරීක්ෂක ආර්. ඩබ්. එම්. මධුෂානි නිලධාරිනිය සහභාගී වූ අතර මෙම පැමිණිල්ල සම්බන්ධයෙන් පහත ප්‍රකාශය කොමිෂන් සභාව වෙත ලබාදෙන ලදි. පැමිණිලිකාරිය විසින් 2024.08.09 වන දින පොලිස් ස්ථානයට පැමිණ බප/කළු/නැහින්න කණිෂ්ඨ විද්‍යාලයේ පළමු ශ්‍රේණියේ ඉගෙනුම ලබන සිය මිණිබිරියට පන්තිභාර ගුරුවරිය වන අනෝමා මිය විසින් පහරදුන් බවට WCIB 73/55 (MCR 1235/2024) යටතේ පැමිණිල්ලක් කර ඇත. එකී පැමිණිල්ලෙහි දක්වා ඇත්තේ, 2024.08.08 දින වින්දිත දැරිය පාසල් ගොස් සිටින විට පන්තිභාර ගුරුතුමිය වන අනෝමා ගුරුවරිය විසින් දැරියට වේවැලෙන් පහරදී ඇති බවත්, දැරිය බියවී සිටි බැවින් පැමිණිලිකාරිය ඒ පිළිබඳව දැරියගෙන් විමසූ පසු මෙම පහරදීම සම්බන්ධයෙන් ප්‍රකාශ කළ බවත්, පසුව පැමිණිලිකාරිය විසින් දැරිය පරීක්ෂා කිරීමේදී දැරියගේ අතේ සහ පිට ප්‍රදේශය ඉදිමී තිබෙන බව දුටු බවත්, මේ පිළිබඳව කළුතර කලාප අධ්‍යාපන කාර්යාලය වෙත ද පැමිණිලි කර පසුව පොලිස් ස්ථානය වෙත ද පැමිණිලි කිරීමට පැමිණි බවත් තමාහට දැරිය රෝහල්ගත කිරීමට අවශ්‍ය නොවන බවත්, ගුරුතුමිය පොලිස් ස්ථානයට කැඳවා නැවත දරුවාට පහරදීමක් නොකරන ලෙසට ගුරුතුමියට අවවාද කිරීම ප්‍රමාණවත් බව පැමිණිල්ලේ සඳහන් කර ඇති බව ප්‍රකාශ කරන ලදි.

පසුව කාන්තා උප පොලිස් පරීක්ෂක ආර්. ඩබ්. එම්. මධුෂානි නිලධාරිනිය විසින් දැරිය පරීක්ෂා කිරීමේදී දැරියගේ කොන්ද සහ වම් අත ප්‍රදේශයේ සීරීම් සලකුණු දුටු බවත් ඒය පැමිණිල්ල සටහන් කිරීමේදී නිරීක්ෂණ සටහන් ලෙස ඇතුළත් කර පැමිණිලිකාරියගේ ප්‍රකාශය සටහන් කරගත් බවත්,

පසුව බප/කළු/නැහින්න කණිෂ්ඨ විද්‍යාලයේ විදුහල්පතිනිය වන සිංහබාහු මිය වෙත රාජකාරී දුරකථනයෙන් ඇමතුමක් ගෙන මෙම පැමිණිල්ල විභාග කිරීම සඳහා එදිනම එනම් 2024.08.09 වන දින ප.ව. 2.30 ට පළමු ශ්‍රේණිය භාර ගුරුවරිය වන අනෝමා ගුරුවරිය ද සමග පොලිස් ස්ථානයේ ළමා හා කාන්තා කාර්යාංශය වෙත පැමිණෙන ලෙස දැනුම්දුන් බවත් සඳහන් කර ඇත. එකී දැනුම්දීම මත පැමිණිල්ලට අදාළ පැමිණිලි පාර්ශවය සහ වගඋත්තර පාර්ශවය ස්ථානයට පැමිණිලි පසු කාන්තා උප පොලිස් පරීක්ෂක ආර්. ඩබ්. එම්. මධුෂානි නිලධාරිනිය විසින් පැමිණිල්ල විභාග කළ බවත් එහිදී අනෝමා ගුරුවරිය විසින් අදාළ වින්දිත දැරිය නිසි ලෙස පාසල් වැඩ කිරීම දුර්වල නිසා වේවැලෙන් දැරියට පාරක් ගැසූ බව පිළිගත් අතර, එය දරුවා පිළිබඳ වෛරී චේතනාකින් නොවන බවට ප්‍රකාශ කළ බවත් සඳහන් කර ඇත. පසුව දෙපාර්ශවයේම ප්‍රකාශ සටහන් කොට පැමිණිලිකාරියගේ එකඟතාවය මත වගඋත්තරකාරිය වන අනෝමා විජේරත්න මිය වෙත මින් ඉදිරියට කිසිදු අවස්ථාවකදී වින්දිත දැරියට තරවටු කිරීමක් හෝ පහරදීමක් සිදු නොකරන ලෙසට අවවාද කර දෙපාර්ශවයේම එකගතාවය මත පැමිණිල්ල සමථයකට පත් කිරීමෙන් පසු දෙපාර්ශවය විසින්ම සමථයට අත්සන් තැබූ බැවින් මෙකී පැමිණිල්ල අවසන් කළ බව කාන්තා උප පොලිස් පරීක්ෂක ආර්. ඩබ්. එම්. මධුෂානි නිලධාරිනිය විසින් ප්‍රකාශ කරන ලදි.

2024.10.30 දිනැතිව ස්ථානාධිපති (දොඩංගොඩ පොලිස් ස්ථානය) විසින් උද්ධෘත සහිත වාර්තාවක් යොමුකර උක්ත කරුණු වැඩිදුරටත් සනාථ කර තිබේ. මානව හිමිකම් කොමිෂන් සභාවේදී 2024.10.30. දින පැමිණිල්ල විභාගයට ගත් අවස්ථාවේදී පැමිණිලිකාරිය විසින් වැඩිදුරටත් ප්‍රකාශ කර සිටියේ, තමාට 2024.08.12 දින පාසල් භූමියේදී දෙමාපියන් හය දෙනෙකු විසින් සිදුකළ පහරදීම සම්බන්ධයෙන් පොලිස් ස්ථානයට කරන ලද පැමිණිල්ල පොලිස් ස්ථානය විසින් නිසියාකාරව සටහන් කර නොගත් බවත් ඒකී පහරදීම සමථ මණ්ඩලයට යොමු කළ නමුත් මේවන තෙක් සමථ මණ්ඩලය විසින් කැඳවීමක් නොකළ බවත් ය. මෙ සම්බන්ධයෙන් කාන්තා උප පොලිස් පරීක්ෂක ආර්. ඩබ්. එම්. මධුෂානි නිලධාරිනිය ප්‍රකාශ කර සිටියේ, පැමිණිලිකාරිය විසින් 2024.08.12 වන දින ඇයට පහරදුන් බවට දෙමාපියන් හතර දෙනෙකුගේ නම් පමණක් සඳහන් කළ බවත් එකී පැමිණිල්ල අනුව 2024.08.19 වන දින දෙපාර්ශවයම කැඳවා ප්‍රකාශ සටහන් කර ගැනීමෙන් පසු අධිකරණ වෛද්‍ය පෝරම ලබාදී රෝහල්ගත වීම සඳහා අවශ්‍ය උපදෙස් ලබාදුන් බවත්, පැමිණිල්ල සමථ මණ්ඩලය වෙත යොමුකළ බවත් ය. මේවන තෙක් සමථ මණ්ඩලයෙන් කැඳවීමක් සිදුකර නොමැති නම් ඒ පිළිබඳව කඩිනමින් සොයාබලා අවශ්‍ය පියවර ගැනීමට හැකියාව ඇති බවත්, පැමිණිලිකාරියට සිදුකළ පහරදීම සම්බන්ධයෙන් තවත් වගඋත්තර කරුවන් සිටී නම් පොලිස් ස්ථානයට පැමිණ ඒ පිළිබඳව පැමිණිලිකරන ලෙසත් ඉන් පසු ඊට අදාළ විමර්ශන කටයුතු සිදුකිරීමේ හැකියාව පවතින බවත් වැඩිදුරටත් එම නිලධාරිනිය විසින් ප්‍රකාශ කරන ලදි.

පැමිණිල්ල සනාථ කිරීම :

මෙම පැමිණිල්ල ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් 2024.08.22 දින විභාගයට ගන්නා ලද අවස්ථාව වන විටත් වින්දිත දැරිය අධිකරණ වෛද්‍යවරයෙකු වෙත යොමුකර නොතිබූ බැවින් කොමිෂන් සභාව විසින් නාගොඩ අධිකරණ වෛද්‍ය නිලධාරී කාර්යාලය වෙත දැරිය රැගෙන යන මෙන් ලිපියක් සමඟ පැමිණිලිකාරිය යොමුකිරීම සිදුකරන ලදි. ඒ අනුව 2024.08.23 දින පැමිණිලිකාරිය විසින් සිය මිණිබිරිය නාගොඩ අධිකරණ වෛද්‍ය නිලධාරී වෙත යොමුකර ඇති අතර අධිකරණ වෛද්‍ය කාර්යාලය මගින් SR 3182/24 යටතේ අධිකරණ වෛද්‍ය වාර්තාවක් නිකුත් කර ඇත. එකී අධිකරණ වෛද්‍ය වාර්තාවේ සඳහන් කරුණු පහත පරිදි වේ.

අධිකරණ වෛද්‍ය වාර්තාවෙහි රෝගියා විසින් ලබාදෙන ලද කෙටි රෝග ඉතිහාසය යන්නෙහි, "2024.08.08 දින නැහින්න කණිෂ්ට විදුහලේ පළමු වසරේ ඉගෙනුම ලබන සෙනුරි දියණියහට එම පන්තියභාර අනෝමා ගුරුතුමිය විසින් අකුරු ලිවීමට ප්‍රමාද වූවායැයි පවසා වේවැලකින් පහර කීපයක් ගසා ඇති බවත්, දැරියගේ පිටේ සහ අත්වල වේවැල් පාරවල් වලට රතුවී ඉදිමී තිබූ බවත්, එදින රාත්‍රියේ දැරියට උණ රෝගය වැළඳුනු බවත් සඳහන් කර ඇත. තවද දැරිය කල්පනා කර කර සිටින බවත්, රාත්‍රී නින්දෙන් ඇහැරී ගුරුවරිය පැවසූ දේවල් කෑ ගසා කියමින් හඬන බවත් පාසල් යාමට නොහැකි බව ප්‍රකාශ කරන බවත්" එහි වැඩිදුරටත් සඳහන් කර ඇත. මෙකී තොරතුරු අනුව අධිකරණ වෛද්‍යවරයා විසින් වින්දිත දැරිය පරික්ෂා කිරීමෙන් අනතුරුව පහත සඳහන් රෝග නිරීක්ෂණ සටහන් කර තිබේ.

1. සෙ.මී. 2 පමණ දිගට වියළී ගිය තැළීම් තුවාලයක්, වම් අතේ මැදට වන්නට වක්‍රාකාර දැකගත හැක. තුවාලයේ අවසානය වම් වැළමිට දෙසට සෙ.මී. 8 පමණ ආසන්නවී ඇත. (A fading tramline contusion, nearly 2 cm in length, placed obliquely the outer surface of the middle 1/3rd of the left arm. The proximal end of the injury is located 8 cm from the left elbow.)
2. සෙ.මී. 2.5 පමණ දිගට වියළී ගිය තැළීම් තුවාලයක්, වම් අතේ මැදට වන්නට වක්‍රාකාර දැකගත හැක. තුවාලයේ අවසානය වම් වැළමිට දෙසට සෙ.මී. 2 පමණ ආසන්නවී ඇත. (A fading tramline contusion, nearly 2.5 cm in length, placed obliquely on the outer surface of the lower 1/3rd of the left arm. The proximal end of the injury is located 2 cm from the left elbow.)

අධිකරණ වෛද්‍යවරයා විසින් නිකුත් කරන ලද ඉහත නිරීක්ෂණ සම්බන්ධයෙන් දරණ මතය ලෙස, "තුවාල අංක 1 සහ 2 තැළීම් තුවාළ වන අතර එය සිලින්ඩරාකාර හෝ ඍජුකෝණාස්‍රාකාර මතුපිටක් සහිත මොට ආයුධයක් හේතුවෙන් සිදුවී ඇත. වයස සහ තුවාල රටාව තුවාළකරුගේ ඥාතියා විසින් ලබාදෙන ලද රෝග ඉතිහාසය හා ගැළපේ. " යනුවෙන් සඳහන් කර ඇත. (The

injury number 1 and 2 are fading tramline contusion that may causes following assaulted with blunt weapon/s with a cylindrical or rectangular contact surface. Aging and the pattern of injury are compatible with the history give by the relative of the injured.)

මෙම පැමිණිල්ල කොමිෂන් සභාව විසින් විභාගයට ගන්නා ලද අවස්ථාවේදී, පළමු වන වගඋත්තරකරු වන පළමු ශ්‍රේණියේ පන්තිභාර ගුරුවරිය වන කේ. ඒ. ඒ. විජේරත්න මිය විසින් මෙම සිදුවීම සිදුවූ 2024.08.08 වන දින, දරුවන්ට පිල්ලම් සහිත අකුරු සහ ඉලක්කම්පත් භාවිතා කරමින් ක්‍රියාකාරකම් වල නියැළෙමින් සිටි අවස්ථාවේදී වින්දිත දැරියට එම ක්‍රියාකාරකම් කියා දීමට උත්සාහ කළ නමුත් ඒ සඳහා දැරිය අවධානය ලබානොදුන් බැවින් වෙනත් පන්තියක දිග මැනීම සඳහා ගෙනවිත් තිබූ කුඩා කෝටුවකින් දරුවා අදාළ නිපුණතා මට්ටමට ගතයුතු බැවින් සත් භාවයෙන් තරවටු කිරීමක් සිදුකිරීමට සිදුවූ බව කොමිෂන් සභාවට ප්‍රකාශ කර ඇත.

එමෙන්ම දෙවන වගඋත්තරකරු වන තමා බප/කළු/නැහින්න කණිෂ්ඨ විද්‍යාලයේ විදුහල්පති පී. එම්. සිංහබාහු මිය විසින් 2024.08.08 දින වින්දිත දැරියගේ අත්තම්මා පැමිණ මෙම පහරදීම පිළිබඳ පැමිණිලි කළ බවත්, පහරදුන් ගුරුවරයා වන පළමුවන වගඋත්තරකරු වෙත තමා එවැනි වැරදි නොකරන ලෙස තදින් අවවාද දුන් බවත් කොමිෂන් සභාව වෙත ප්‍රකාශ කර ඇත. තවද තමා වින්දිත දැරිය ලඟට පෙර පරීක්ෂා කිරීමේදී දැරියගේ අත් දෙකේ දෙපැත්තේ සහ කොන්ද ප්‍රදේශයේ රතු පාට ලප දැකගත හැකි වූ බවත් ප්‍රකාශ කර ඇත.

තවද දොඩංගොඩ පොලිස් ස්ථානයේ ස්ථානාධිපති විසින් 2024.10.30 දිනැතිව කොමිෂන් සභාව වෙත යොමුකරන ලද වාර්තාව මගින්, ළමා හා කාන්තා තොරතුරු සටහන් පොතේ පිටුව 81 ඡේදය 58 යටතේ පළමුවන වගඋත්තරකරු විසින් 2024.08.08 දින ඉගැන්වීම් කටයුතු අතරතුර වින්දිත දරුවා පාඩම් වැඩවලට දුර්වල බැවින් වේවැලෙන් එක පාරක් ගැහුවා. එසේ ගැහුවේ දරුවා හදාගැනීමට මිස වෛරී චේතනාවකින් නොවන බවට ප්‍රකාශයක් ලබාදී ඇත.

දොඩංගොඩ පොලිස් ස්ථානයේ ළමා හා කාන්තා කාර්යාංශයේ ස්ථානාධිපති කාන්තා උප පොලිස් පරීක්ෂක ආර්. ඩබ්. එම්. මධුෂානි නිලධාරිනිය විසින් 2024.08.09 දින වින්දිත දැරිය පරීක්ෂා කිරීමේදී දැරියගේ කොන්ද සහ වම් අත ප්‍රදේශයේ සීරීම් සලකුණු දුටු බවත් එය පැමිණිල්ල සටහන් කිරීමේදී නිරීක්ෂණ සටහන් ලෙස ඇතුළත් කළ බවත් කොමිෂන් සභාව වෙත ප්‍රකාශ කර ඇත.

**නිරීක්ෂණ :**

- පැමිණිල්ලෙහි දක්වා ඇති පරිදි පැමිණිලිකාරියගේ වයස අවුරුදු 05 යි මාස 07 ක් වූ මිණිබිරිය වන පී.පී.ඩී. සෙනුරි ශාක්‍යා අභිමානි යන දැරිය විසින්, මෙම සිදුවීම සිදුවූ දින එනම් 2024.08.08 දින දහවල් සිය මිත්තණිය වෙත ඇයගේ පන්තිභාර ගුරුතුමිය වන අනෝමා ගුරුවරිය විසින් තමාට පහරදුන්නා යැයි පැවසූ බව පැමිණිලිකාර පාර්ශවය විසින් සඳහන් කර ඇත. වින්දිත දැරියගේ එම

ප්‍රකාශනය මෙම පැමිණිල්ලේ වැදගත් සාක්ෂියක් ලෙස නිරීක්ෂණය වේ. තවද එම අවස්ථාවේදීම පැමිණිලිකාරිය වන මිත්තණිය විසින් වින්දිත දැරිය පරීක්ෂා කර ඇති අතර, එහිදී වේවැල් පහර කෑම හේතුවෙන් අත් දෙක සහ කොන්ද ප්‍රදේශය ඉදිමී තිබූ සලකුණු පැමිණිලිකාරිය විසින් දුටු බව සඳහන් කර ඇත. එම සාක්ෂිය මෙවැනි පහරදීමක් සිදුවී ඇද්ද යන්න සම්බන්ධයෙන් පළමු වරට නිරීක්ෂණය කරන ලද ඇසින්දුටු සාක්ෂියක් බවට පැහැදිලි වේ.

- තවද පැමිණිලිකාරිය විසින් එදිනම මෙම පහරදීම සම්බන්ධයෙන් එම පාසලේ විදුහල්පතිනිය වන සිංහබාහු මිය වෙත දහවල් 12.30 ට පමණ පැමිණිලි කර ඇත. විදුහල්පතිනිය විසින් කොමිෂන් සභාවට ලබාදී ඇති ප්‍රකාශයෙහි විදුහල්පතිනිය විසින් වින්දිත දැරිය එදින පරීක්ෂා කළ බවත් දැරියගේ අත් දෙකේ සහ කොන්ද ප්‍රදේශයේ රතු පාටින් සලකුණු දුටු බවත් ප්‍රකාශ කර ඇත. එම ප්‍රකාශය අනුව මෙම පහරදීම සිදුවූ දිනම දෙවන වරටත් වින්දිත දැරිය පරීක්ෂාවට ලක්කර පහරදීමක සලකුණු නිරීක්ෂණය කරන ලද දෙවන සාක්ෂිය බව පෙනීයයි. එමෙන්ම 2024.08.09 දින පැමිණිලිකාරිය විසින් දොඩංගොඩ පොලිස් ස්ථානයට පැමිණිලි කළ පසු ළමා හා කාන්තා කාර්යාංශයේ උප පොලිස් පරීක්ෂක ආර්. ඩබ්. එම්. මධුෂානි නිලධාරිනිය විසින් වින්දිත දැරිය පරීක්ෂා කර ඇති අතර එහිදී පහරදීමක සලකුණු දුටු බවට නිරීක්ෂණ සටහන් යොදා ඇත. එය මෙම පහරදීම සිදුවූ දිනට පසුදින යොදන ලද නිරීක්ෂණ සටහනක් වන අතර එදින වන විටත් පහරදීමක සලකුණු තිබී ඇති බවට පැහැදිලි වේ.

- තවද කොමිෂන් සභාවේ නියමය පරිදි 2024.08.23 වන දින අධිකරණ වෛද්‍යවරයා විසින් වින්දිත දැරිය පරීක්ෂාවට භාජනය කර ඇත. එකී පරීක්ෂාවෙන් අනතුරුව අධිකරණ වෛද්‍ය නිලධාරිවරයා විසින් නිකුත් කරන ලද වෛද්‍ය වාර්තාවෙහි, රෝගියාගේ ඥාතියා විසින් ලබාදෙන ලද රෝග ඉතිහාසය, තුවාල රටාව සමග ගැළපෙන බව සඳහන් කර ඇත. ඒ අනුව මෙම සිදුවීම සිදුවූ දින සිට දින 15 ට පසු සිදුකරන ලද වෛද්‍ය පරීක්ෂණයේදී ද පහරදීමක සලකුණු තිබී ඇති බවට නිරීක්ෂණය වේ. මෙකී ලිඛිත සහ වාචික සාක්ෂි වලට අමතරව මෙම පැමිණිල්ලේ ප්‍රධාන වගඋත්තරකරු වන කේ. ඒ. ඒ. විජේරත්න මිය විසින් පොලිස් ස්ථානයේදී සිදුකරන ලද පැමිණිල්ල විභාගයේදී මෙන්ම මානව හිමිකම් කොමිෂන් සභාවේදී පවත්වන ලද විභාගයේදී තමා විසින් මෙම වින්දිත දැරියට පහරදුන් බව පිළිගෙන ඇත. උක්ත සියලුම සාක්ෂි අනුව පළමුවන වගඋත්තරකරු වන කේ. ඒ. ඒ. විජේරත්න මිය විසින් මෙම පහරදීම සිදුකර ඇති බවට කොමිෂන් සභාවට සනාථ වේ.

- 2024.08.08 දින සිදුවූ මෙම සිදුවීම සම්බන්ධයෙන් පැමිණිලිකාරිය විසින් බප/කළු/නෑහින්න කණිෂ්ඨ විද්‍යාලයේ විදුහල්පතිනිය දැනුවත් කර තිබුණ ද, විදුහල්පතිනිය විසින් වින්දිත දැරිය පරීක්ෂා කිරීමේදී පහරදීමක සලකුණු තිබූ බවට දැක තිබුණ ද දැරිය රෝහල්ගත කිරීමට පැමිණිලිකාරියට උපදෙස් ලබාදීම සිදුකර නොමැත. එදින පාසල් ලොග් සටහන් පොතෙහි

සටහනක් තබා පහරදීම සිදුකළ පළමුවන වගඋත්තරකරු වෙත අවවාද දීම පමණක් සිදුකර ඇති අතර මේ සම්බන්ධයෙන් කළුතර අධ්‍යාපන කලාප කාර්යාලය දැනුවත් කර ඇත්තේ 2024.08.09 දින පැමිණිලිකාරිය විසින් නැවත වරක් පාසලට පැමිණ විදුහල්පති වෙත මෙකී පහරදීම හේතුවෙන් දැරියට උණ වැළදී ඇති බවට ප්‍රකාශ කළ පසුව බව නිරීක්ෂණය වේ. ඒ පිළිබඳව පාසල් ලොග් සටහන් පොත් අංක 10 හි පිටු අංක 316 යටතේ "2024.08.09 දින පැමිණිලිකාරිය කලාප කාර්යාලයට යන බව පවසා පිටත්ව ගිය බවත් මේ පිළිබඳව ඒ මොහොතේ කලාප කාර්යාලයේ පාසල් පාලන අධ්‍යක්ෂතුමිය වෙත දුරකථනයෙන් දැනුම් දුන්බවට" යොදන ලද සටහන අනුව පැහැදිලි වේ. ඒ අනුව පාසලේ පාලනාධිකාරිය විසින් මෙකී සිදුවීම සම්බන්ධයෙන් ලබාදී ඇති අවධානය සහ සැලකිලිමත්භාවය ඉතාමත් අවම මට්ටමක තිබී ඇති බවත්, විදුහල්පති වශයෙන් ගත යුතු නීත්‍යානුකූල පියවරයන් ගැනීමට ප්‍රමාදවී ඇති බවත් නිරීක්ෂණය වේ.

- පැමිණිලිකාරිය විසින් කළුකර කාලප අධ්‍යාපන කාර්යාලය වෙත 2024.08.09 වන දින මෙම සිදුවම සම්බන්ධයෙන් සිදුකරන ලද පැමිණිල්ල අනුව 2024.08.12 වන දින දෙපාර්ශවය කැඳවා වැඩිදුර ප්‍රකාශ සටහන් කරගෙන ඇති අතර, මෙම පහරදීම සිදුකරන ලද පළමුවන වගඋත්තරකරු වන අනෝමා විජේරත්න මෙනවිය තාවකාලිකව බප/කළු/නෑහින්න කණිෂ්ඨ විද්‍යාලයේ සිට කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය වෙත මාරු කර ඇති බවට නිරීක්ෂණය වේ. තවද මෙම සිදුවීම පිළිබඳව විමර්ශනයක් සිදුකර විමර්ශන වාර්තාව පළාත් අධ්‍යාපන කාර්යාලය වෙත යොමුකර ඇති අතර විධිමත් විනය පරීක්ෂණයක් පැවැත්වීම සඳහා චෝදනා පත්‍රයක් සකස් කිරීමට අවශ්‍ය පියවර ද ගෙන තිබේ. ඒ අනුව මෙම සිදුවීම සම්බන්ධයෙන් තුන්වන වගඋත්තර පාර්ශවය වන කළුතර කලාප අධ්‍යාපන කාර්යාලයේ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ ඒ. යූ. වික්‍රමආරච්චි මයා විසින් අවශ්‍ය පියවරයන් ගෙන ඇති බවට නිරීක්ෂණය වේ.

- පැමිණිලිකාරිය විසින් සිය පැමිණිල්ල මගින් දොඩංගොඩ පොලිස් ස්ථානයට 2024.08.09 සහ 2024.08.12 යන දිනයන්හිදී සිදුකරන ලද පැමිණිලි වලට සාධාරණ විමර්ශනයක් සිදු නොකළ බවත් සිය මිණිබිරිය රෝහල්ගත කිරීමට අවශ්‍ය උපදෙස් පොලිස් ස්ථානය මගින් ලබානොදුන් බවට චෝදනා ඉදිරිපත් කර තිබේ. ඒහෙත් දොඩංගොඩ පොලිස් ස්ථානයේ ස්ථානාධිපති විසින් 2024.10.30 දිනැතිව යොමුකරන ලද වාර්තාව අනුව සහ එදින පවත්වන ලද පැමිණිලි විභාගය සඳහා කොමිෂන් සභාවට කැඳවන ලද ළමා හා කාන්තා කාර්යාංශයේ කාන්තා උප පොලිස් පරීක්ෂක ආර්. ඩබ්. එම්. මධුෂානි නිලධාරිනිය විසින් ප්‍රකාශ කළ කරුණු අනුව පැමිණිලිකාරිය විසින් 2024.08.09 දින සිය මිණිබිරියට පහරදීම සම්බන්ධයෙන් සිදුකරන ලද පැමිණිල්ල එදිනම ප.ව. 2.30 ට පමණ දෙපාර්ශවය කැඳවා විභාග කොට ප්‍රකාශ සටහන් කරගෙන ඇති අතර දෙපාර්ශවයේම ඒකඟතාවය මත ඒම පැමිණිල්ල සමථයකට පත්කර අවසන්කර ඇති බව නිරීක්ෂණය වේ.

- සිය මිණිබිරිය රෝහල්ගත කිරීමට පොලිස් ස්ථානය මගින් අවශ්‍ය උපදෙස් ලබානොදුන් බවට පැමිණිලිකාරිය විසින් ඉදිරිපත් කරනු ලබන චෝදනාව සම්බන්ධයෙන් උප පොලිස් පරීක්ෂක ආර්. ඩබ්. එම්. මධුෂානි නිලධාරිනිය විසින් ප්‍රකාශකර සිටින්නේ, පැමිණිලිකාරියගෙන් දැරිය රෝහල් ගත කිරීමට අවශ්‍යදැයි විමසූ විට අවශ්‍ය නොවන බව ප්‍රකාශ කළ බැවින් ඒ සඳහා කටයුතු නොකළ බවයි. පොලිස් ස්ථානයට පැමිණිලිකාරිය විසින් ලබාදෙන ලද ප්‍රකාශයෙහි ද ඒ පිළිබඳව සඳහන් කර ඇති බවට නිරීක්ෂණය වේ. කරුණු එසේ වුවත්, මෙකී පහරදීමට භාජනයවී ඇත්තේ වයස අවුරුදු 05 යි මාස 07 පමණ කුඩා දැරියක් වන බැවින් ළමා හා කාන්තා කාර්යාංශය විසින් දැරියගේ වයස සහ සිදුවීම පිළිබඳව සලකාබලා දැරිය රෝහල් ගත කිරීමට අවශ්‍ය පියවර ගැනීම සිදුකළ යුතුව තිබුණු බවට කොමිෂන් සභාවට නිරීක්ෂණය වේ. තවද, උප පොලිස් පරීක්ෂක ආර්. ඩබ්. එම්. මධුෂානි නිලධාරිනිය විසින් වින්දිත දැරිය පරික්ෂා කිරීමේදී පහරදීමක සලකුණු දුටුබවට නිරීක්ෂණ සටහන් ද යොදා පැමිණිලිකාරියට අවශ්‍ය නොවූ බැවින් රෝහල් ගත කිරීමට කටයුතු නොකළ බවට සඳහන් කිරීම මගින් ළමා හා කාන්තා කාර්යාංශයේ වගකීම් නිසියාකාරව ඉටුනොකිරීමක් ලෙස නිරීක්ෂණය වේ. එමෙන්ම පොලිස් ස්ථානයට ඉදිරිපත් කරන ලද පැමිණිල්ල සමථයකට පත්වූ වූ දක්වා ඇති නමුත්, මෙම සිදුවීමට භාජනයවී ඇත්තේ කුඩා දැරියක්වන බැවින් වින්දිත දැරිය රෝහල් ගත කිරීමේ වගකීම කාර්යාංශය වෙත පැවරෙන බවට නිරීක්ෂණය වේ. එබැවින් එකී කාර්යය දොඩංගොඩ පොලිස් ස්ථානයේ ළමා හා කාන්තා කාර්යාංශය විසින් නිසායාකාර ඉටුකර නොමැති බව පෙනීයයි.

- තවද, පැමිණිලිකාරිය විසින් 2024.08.12 දින පාසලේ දෙමාපියන් පිරිසක් තමාට පහරදුන් බවට දොඩංගොඩ පොලිස් ස්ථානයට කරන ලද පැමිණිල්ල 2024.08.19 දින දෙපාර්ශවය කැඳවා විභාගකොට ප්‍රකාශ සටහන් කරගෙන ඇති අතර පහරකෑමට ලක්වූ පාර්ශවයන් වෙත රෝහල්ගත කිරීමට අවශ්‍ය උපදෙස් ලබාදී පැමිණිල්ල සමථ මණ්ඩලය වෙත යොමුකර ඇති බව නිරීක්ෂණය වේ. සමථ මණ්ඩලය විසින් 2024.10.30 දිනය වන තෙක් කැඳවීමක් සිදුකර නොතිබීම සම්බන්ධයෙන් විමසා බැලීමට කාන්තා උපපොලිස් පරීක්ෂක ආර්. ඩබ්. එම්. මධුෂානි නිලධාරිනිය කොමිෂන් සභාවේදී ඒකඟතාවයට පැමිණි අතර, පැමිණිලිකාරියට 2024.08.12 දින දෙමාපියන් පිරිසක් පහරදීම සම්බන්ධයෙන් සිදුකරන ලද පැමිණිල්ලට වගඋත්තරකරුවන් තවත් සිටී නම් නැවත ඒ පිළිබඳව පොලිස් ස්ථානයට පැමිණිලිකරන මෙන් ද ඒ පිළිබඳව විමර්ශනය කොට එවැනි තත්ත්වයක් ඉදිරියේදී සිදුනොවීමට අවශ්‍ය පියවර ගන්නා බවට ද එම නිලධාරිනිය විසින් වැඩිදුරටත් ඒකඟතාවය පළකර ඇති බවට නිරීක්ෂණය වේ.

නිගමනය :

1989 නොවැම්බර් මස 20 වන දින එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද "ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තියෙහි" (Convention on the Rights of the Child) පාර්ශවකරුවෙකු ලෙස 1991 වසරේදී ශ්‍රී ලංකාව අත්සන් තබා ළමා අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට නෛතිකමය වශයෙන් බැඳී සිටී. එවැනි පසුබිමක බප/කළු/නැඟින්න කණිෂ්ඨ විද්‍යාලයේ පළමුවන ශ්‍රේණියේ ඉගෙනුම ලබන වයස අවුරුදු 05 යි මාස 07 ක පී.පී.ඩී. සෙනුරි ශාක්‍යා අභිමානී යන දැරියට 2024.08.08 දින පාසලේ පන්තිකාමරය තුළදී දැරිය පාඩම් වැඩවලට දුර්වලවීම හේතුවෙන් පළමුවන වගඋත්තරකරු වන කේ. ඒ. ඒ. විජේරත්න මිය විසින් වේවැලක් භාවිතා කර වින්දිත දැරියට පහරදීම සම්බන්ධයෙන් අධිකරණ වෛද්‍යවරයාගේ මතය, පළමුවන වගඋත්තරකරු විසින්ම සිදුකරන ලද පහරදීම පිළිගැනීම යන සාක්ෂි මත පදනම්වන මෙකී පහරදීම සිදුකරන ඇති බවට කොමිෂන් සභාවට පෙනීයයි. එමෙන්ම ප්‍රාථමික අධ්‍යාපන ලබන දරුවන් උදෙසා අධ්‍යාපනය ලබාදිය යුතු ආකාරය සම්බන්ධයෙන් විශේෂ චක්‍රලේඛ, විධිවිධාන, මාර්ගෝපදේශ මගින් ප්‍රාථමික අංශ ගුරුවරුන් නිරන්තරයෙන් පුහුණු කිරීම දැනුවත් කිරීම සිදුකර තිබිය දී වයස අවුරුදු 05 මාස 07 දැරියක්හට පහරදී ඇති බවට කොමිෂන් සභාවට නිරීක්ෂණය වේ.

ඒ අනුව වින්දිත දැරිය සම්බන්ධයෙන්, **1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ 11 වන ව්‍යවස්ථාව මගින් ප්‍රකාශිත "කිසිදු තැනැත්තෙකු වධහිංසාවකට හෝ කෲර අමානුෂික හෝ අවමන් සහගත සැලකිල්ලකට නැතහොත් දඬුවමකට යටත් නොකළ යුත්තේය"** යන මූලික අයිතිවාසිකම පළමුවන වගඋත්තරකරු වන කේ. ඒ. ඒ. විජේරත්න මිය විසින් උල්ලංඝනය කර ඇති බවට ශ්‍රී ලංකා මානව හිමිකම කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබේ. ඒ අනුව පහත නිර්දේශ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් ඉදිරිපත් කරනු ලැබේ.

නිර්දේශ :

1. මෙකී සිදුවීමට භාජනය වූ වින්දිත දැරිය වයස අවුරුදු 05 ක පමණ කුඩා දැරියක් වන බැවින් පළමුවන වගඋත්තරකරු වන කේ. ඒ. ඒ. විජේරත්න මිය විසින් වින්දිත දැරියගේ වර්තමාන භාරකාරත්වය දරන පැමිණිලිකාරිය වෙත රු.10,000/- මුදලක් ගෙවිය යුතුය.

<u>ලේකම් (අධ්‍යාපන අමාත්‍යාංශය) විසින්,</u>

2. පළමුවන වගඋත්තරකරු වන කේ. ඒ. ඒ. විජේරත්න මිය සම්බන්ධයෙන් සුදුසු විනයානුකූල පියවර ගැනීමට කටයුතු කළ යුතු අතර, එසේ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳව කොමිෂන් සභාව දැනුවත් කළ යුතු ය.

<u>**පොලිස්පතිවරයා විසින්,**</u>

3. දොඩංගොඩ පොලිස් ස්ථානයේ ළමා හා කාන්තා කාර්යාංශයේ නිලධාරීන් විසින් මෙම සිදුවීම වාර්තා වූ මුල් අවස්ථාවේ ක්‍රියාකර ඇති ආකාරය සම්බන්ධයෙන් සෑහීමකට පත්විය නොහැක. එබැවින් එම නිලධාරීන් සම්බන්ධයෙන් සුදුසු පියවරක් ගැනීමට කටයුතු කළ යුතු අතර, එසේ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳව කොමිෂන් සභාව දැනුවත් කළ යුතුය.

2025.01.16 වන දිනට පෙර මෙකී නිර්දේශ ක්‍රියාත්මක කර ඒ සම්බන්ධයෙන් වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වන වගන්ති ප්‍රකාරව වගඋත්තර පාර්ශවය වෙත දන්වමු.

එසේම, එකී නිර්දේශ ක්‍රියාත්මක කර ඉදිරිපත් කිරීමට නියමිත දින සිට සතියක කාලයක් තුළ මෙම නිර්දේශ ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකාර පාර්ශවය විසින් ද කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බව ද වැඩිදුරටත් දන්වමු.

එල්.ටී.බී. දෙහිදෙණිය,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (හිටපු)
සභාපති.

නිමල් ජී. පුංචිහේවා,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

විනිසුරු එල්.ටී.බී.දෙහිදෙණිය
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී. පුංචිහේවා
ජ්‍යෙෂ්ඨ නීතිඥ
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

පිටපත :-

1. අමාත්‍යතුමා, අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය, බත්තරමුල්ල. - කා.දැ.ගැ.ද
2. ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය, බත්තරමුල්ල. - ඉහත නිර්දේශ ප්‍රකාරව පියවර ගැනීම
3. පොලිස්පති, පොලිස් මූලස්ථානය, කොළඹ 01. - ඉහත නිර්දේශ ප්‍රකාරව පි.ගැ.